රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/චක්‍රලේඛ(V2)

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234 / A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2025.12.11

**චක්‍රලේඛ අංකය : 04/2025**

සියලුම ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත

**<u>දිට්වා සුළිකුණාටුවේ බලපෑමෙන් ඇති වූ නාය යෑම් හා ගංවතුර හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම.</u>**

ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ස්වභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් හේතුවෙන් අතුරුදහන්වූ තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා 2005 අංක 17 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත හා 2016 අංක 16 දරණ මරණ ලියාපදිංචි කිරීමේ ( තාවකාලික විධිවිධාන) ( සංශෝධන) පනතින් සංශෝධිත 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ ( තාවකාලික විධිවිධාන) පනත මගින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත බලතල පැවරී ඇත. 1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතින් උපත් හා මරණ ලියාපදිංචි කිරීමට පැවරී ඇති බලතල ප්‍රකාරව දිට්වා සුළිකුණාටුවෙන් අතුරුදහන් වූවන්ගේ මරණ ලියාපදිංචි කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ ( තාවකාලික විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව මවිසින් අංක 2465/08 හා 2025.12.02 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ව්‍යසන පාත්‍ර ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ගාල්ල, මාතර හා හම්බන්තොට යන පරිපාලන දිස්ත්‍රික්ක හැර සෙසු පරිපාලන දිස්ත්‍රික්කයන්හි ආපදාවන් හේතුවෙන් සිදු වූ අතුරුදහන්වූවන්ගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා මෙමගින් ප්‍රතිපාදන සැලසේ.

03. ඒ අනුව දිට්වා සුළිකුණාටුවේ බලපෑමෙන් ඇති වූ නාය යෑම් හා ගංවතුර හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තනගේ මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම්පත් භාර ගැනීමේ සිට මරණ ලියාපදිංචි කිරීම දක්වා වූ කාර්ය පටිපාටිය පහත පරිදි වේ.

I. <u>ඉල්ලුම්පත් භාර ගැනීම</u>

<u>ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුත්තේ කා විසින්ද</u>

ඉහත සඳහන් කළ ජාතික ව්‍යසනයේ දී අතුරුදහන් තත්ත්වයට පත් වූ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ ළඟම ඥාතියකු හෝ එම තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ පවුලේ කිසිදු සාමාජිකයෙකු එම ව්‍යසනයෙන් දිවි ගලවාගෙන නොමැති අවස්ථාවක එම අතුරුදහන් වූ අය පිළිබඳව දන්නා තැනැත්තෙකු හෝ එසේ අතුරුදහන් වී ඇති බවට තරයේ විශ්වාස කරන තැනැත්තෙකු විසින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකිය.



දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk rg@rgd.gov.lk

ඉල්ලුම් කළ යුතු ආකාරය

ඉහත කී තැනැත්තෙකු විසින් මියගිය බවට විශ්වාස කරන තැනැත්තා පුරුද්දක් වශයෙන් වාසය කළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා වෙත ( කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ග්‍රාම නිලධාරී වසමෙහි පුරුද්දක් වශයෙන් වාසය කළ තැනැත්තෙකු, මහනුවර දිස්ත්‍රික්කයේ මිණිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි යහන්ගල කන්ද නාය යෑම නිසා හානියට පත් ප්‍රදේශයේ දී ව්‍යවසනයට පත්ව අතුරුදහන් වීමට ලක් වුවද අදාළ ඉල්ලීම සිදු කළ යුතු වන්නේ එම තැනැත්තා පුරුද්දක් වශයෙන් වාසය කළ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිළධාරී වෙතය) ඇමුණුම 01 ප්‍රකාර වූ ඉල්ලුම්පතක් අතුරුදහන් වූ තැනැත්තාගේ හැකි සෑම විස්තරයක්ම ඇතුළත් කරමින් ඉදිරිපත් කළ යුතුය. එකී සෑම ඉල්ලුම්පතක් සමගම එහි ඇතුලත් කරුණු තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම 02)

II. ඉල්ලුම්පත මත ක්‍රියා කිරීම

ඉල්ලුම්පත ග්‍රාම නිලධාරීවරයා වෙත ලැබුණු විට ඔහුට අවශ්‍ය යැයි හැඟී යන පරීක්ෂණයකින් පසුව එම ඉල්ලීම නිර්දේශ කර හැකිනාක් ඉක්මනින් එහි කරුණු පිළිබඳව ඔහුගේ උපරිම දැනීමේ ප්‍රමාණයට නිරවද්‍යතාවය සහතික කරන වාර්තාවක් ද සමග ඇමුණුම 01 හි පසුපිට අනුව එම ග්‍රාම නිලධාරී වසම අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරුණු පිළිබඳ සෑහීමට පත් නොවන්නේ නම් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කළ යුතු අතර, ඒ පිලිබඳව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්විය යුතුය. (ඇමුණුම 03)

III. දැන්වීම ප්‍රදර්ශනය කිරීම හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත දැන්වීම.

ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත ඉල්ලුම්පත්‍රය, ග්‍රාම නිලධාරි වාර්තාව හා දිවුරුම් ප්‍රකාශය ලද පසු ඇමුණුම 04 අනුව වූ දැන්වීම පිටපත් 02 කින් සකස් කර ඉන් එක් පිටපතක් තම කාර්යාලයෙහි දැන්වීම් පුවරුවෙහි සති 2ක කාලයක් ප්‍රදර්ශනය කළ යුතු අතර, අනෙක් පිටපත ඇමුණුම 05 අනුව සකස් කළ ආවරණ ලිපියක් සමග සති දෙකක (02) කාලයක් ග්‍රාම නිලධාරි කාර්යාලයෙහි ප්‍රදර්ශනය කිරීම සඳහා අදාල ග්‍රාම නිලධාරී වෙත යැවිය යුතුය.

සති 02ක ප්‍රදර්ශන කාලය අවසන් වූ වහාම ග්‍රාම නිලධාරී විසින් දැන්වීම ප්‍රදර්ශනය කළ බවට ඇමුණුම 05 හි පහත කොටස අනුව ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත වාර්තා කළ යුතුය.

IV. **විරෝධතා ඉදිරිපත් කිරීම හා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යොමු කිරීම.**

දැන්වීම පළමුවරට ප්‍රදර්ශනය කළ දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී දිවුරුම් ප්‍රකාශයක් සමග ලැබෙන ලිඛිත විරෝධතා පමණක් කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාජනරාල් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් භාරගත යුතු වේ. එසේ භාරගත් විරෝධතා සම්බන්ධ විස්තර ඉල්ලුම්පත් භාර ගැනීමේ ලේඛනයේ සටහන් කර අදාළ විරෝධතාවය ඉල්ලුම්පත සමග ගොනු කළ යුතු වේ. විරෝධතාව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත කර ඇති අවස්ථාවක දී සුදුසු පරීක්ෂණයකින් පසුව තමාගේ අත්සන යටතේ වූ වාර්තාවක් සමග කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවිය යුතුය.

V. **ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් නිර්දේශය**

විරෝධතා ඉදිරිපත් කිරීමේ කාලසීමාව අවසන් වූ විගස ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් එම ඉල්ලුම් පත්‍රය ඇමුණුම 06 අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කලාප භාර නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත නොපමාව ඉදිරිපත් කළයුතුය.

VI. **නියෝගය ලබා දීම**

කලාප භාර නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඉහත කී ලියවිලි පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව එකී මරණය ලියාපදිංචි කිරීම සඳහා නියෝග ලබා දී අතුරුදහන් බවට විශ්වාස කරන අය අතුරුදහන්වූවා යැයි වාර්තාවන ප්‍රදේශය අයත් වන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඇමුණුම 01 පසු පිට හා ඇමුණුම 7 ආකෘතිය යටතේ වූ නියෝගයක් යැවිය යුතුය.

කොට්ඨාස රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී මරණය විධිමත් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව ඉල්ලුම්පතේ සඳහන් ඉල්ලුම්කරුගේ නමට මරණ සහතිකයේ නොමිලයේ නිකුත් කරන පිටපත ලැබීමට සැලැස්විය යුතුය.

VII. **අභියාචනා ඉදිරිපත් කිරීම**

ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට ගත් තීරණයකින් අතෘප්තියට පත් යම් ඉල්ලුම්කරුවෙකුට හෝ විරෝධතා ඉදිරිපත් කර තිබියදීත් මරණ සහතිකයක් නිකුත් කිරීමට ගත් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි එම ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීමට විරුද්ධව අභියාචනයක් අවස්ථාවෝචිත පරිදි එම ප්‍රතික්ෂේප කිරීම හෝ සහතිකය නිකුත් කිරීම පිළිබඳව වූ දැනුම්දීමේ දින සිට මාසයක් ඇතුලත දී රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එසේ ලැබෙන අභියාචනා ඊට අදාළ ඉල්ලුම් පත්‍රය, පරීක්ෂණ සටහන් හා අදාළ ලියවිලි සමග අමුණා කලාප භාර නියෝජ්‍ය /සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

04. විදේශිකයින්ගේ මරණ ලියාපදිංචි කිරීම

විදේශිකයෙකු ශ්‍රී ලංකාවට පැමිණ සිටිය දී ඉහත සඳහන් කළ ස්වභාවික ව්‍යවසනය නිසා අතුරුදහන් වී ඇති බවට සාක්ෂි ඇති අවස්ථාවක ඒ තැනැත්තා සඳහා මරණ සහතිකයක් තමා වෙත නිකුත් කරවා ගැනීම පිණිස ඒ පිළිබඳව දැනීමක් ඇති ඕනෑම අයෙකුට ඉල්ලීමක් කළ හැකිය. ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මියගිය බවට විශ්වාස කරන තැනැත්තා පුරවැසියකුව සිටි රට වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින තානාපතිවරයා හෝ කොන්සල්වරයා සහතික කර,ඉල්ලුම්පත්‍රය කෙලින්ම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් එකී මරණය ලියාපදිංචි කිරීම සඳහා විධි විධාන සලස්වනු ලැබේ.

05. "දක්නට නොමැති බවට වන සහතිකයක්" ඉල්ලුම් කිරීම - මෙම ස්වභාවික ව්‍යසන තත්ත්වය යටතේ යම් තැනැත්තෙකු විසින් දක්නට නොමැති බවට වන සහතිකයක් ඉල්ලුම් කරයි නම්, ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක 11/2016 හා 2016/11/21 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළයුතු වේ.

06. මෙම චක්‍රලේඛයේ උපදෙස් සම්බන්ධයෙන් අතිවිශේෂ ප්‍රමුඛත්වයක් ලබාදී ක්‍රියා කරන මෙන් කාරුණිකව දන්වමි.මේ සඳහා අවශ්‍ය මුද්‍රිත ආකෘති පත්‍ර මේ සමග ඇති ආදර්ශ ආකෘතීන් අනුව සකස්කර ගත යුතු වේ.

07. මෙහි උපදෙස් සම්බන්ධයෙන් ඔබ කොට්ඨාසයේ සේවය කරන සියලුම ග්‍රාම නිලධාරීන්, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කරන ලෙස ද මෙම ස්වභාවික ව්‍යවසනයෙන් අතුරුදහන් වී ඇති තැනැත්තන්ගේ ඥාති හිතමිත්‍රාදීන්ට අතුරුදහන් වී ඇති අය සඳහා මරණ සහතිකයක් ලබා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබා දී ඔවුන්ට සහයෝගය ලබා දෙන ලෙස ද ඔබගේ අධීක්ෂණය යටතේ රාජකාරී ඉටු කරන සියලුම නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එස්. ජලදීපන්
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
[illegible], බත්තරමුල්ල.

එස්.ජලදීපන්

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත් :

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස.
02. කොමසාරිස් ජනරාල්,අත්‍යාවශ්‍ය සේවා දෙපාර්තමේන්තුව - අ.ක.ස.
03. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
04. කලාප භාර සියළුම නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
05. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - අ.ක.ස.

ඇමුණුම 01

## 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

.................................................වසමේ ග්‍රාම නිලධාරී වෙත,

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම: .................................................................

2. ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය: ..........................................................................

3. වයස: ..........................................................................................

4. මරණය සිදු වූ දිනය (ආසන්න වශයෙන්): ...............................................................

5. අවසන් වරට පදිංචිව සිටියේ යැයි දන්නා ස්ථානයේ ලිපිනය : ..........................................

6. ස්ථිර පදිංචිය දැරූ ස්ථානය: ......................................................................

7. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම හා පදිංචි ස්ථානය: ......................................................

8. පදවිය හෝ වෘත්තිය : ..........................................................................

9. අතුරුදහන් වූ තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති ඥාති සම්බන්ධය : ......................................

10. ඉල්ලුම්කරුගේ දුරකථන අංකය: .....................................................................

ඉහත කී ............................................................................................

(අතුරුදහන් වූ තැනැත්තාගේ නම ) යන අය 2025 නොවැම්බර් මස සිදු වූ දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් වූ ස්වභාවික ව්‍යසනය හේතුවෙන් අතුරුදහන්ව සිටින බවත්, එකී...............................

..................................................................................................

(අතුරුදහන් වූ තැනැත්තාගේ නම) අය මිය ගොස් ඇති බව මා තරයේ විශ්වාස කරන බවත්,

..................................................................................(ඉල්ලුම්කරුගේ ලිපිනය)

පදිංචි..............................................................................(ඉල්ලුම්කරුගේ නම)

වන මම මෙයින් ප්‍රකාශ කරමි.

එමනිසා (110 අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ එම මරණය ලියාපදිංචි කරන ලෙස හා එම මරණය සම්බන්ධයෙන් මරණ සහතිකයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලා සිටිමි.

ඉල්ලුම්කරුගේ අත්සන: ............................................ දිනය: ................................

## ග්‍රාම නිලධාරීගේ සහතිකය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / ප්‍රාදේශීය ලේකම්, ..........................................................

මෙහි පසුපිටේ ඇති ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරුණු මාගේ උපරිම දැනීමේ ප්‍රමාණයට නිවරදා බවට සහතික කරමි.එනිසා එම මරණය (110 වැනි අධිකාරය වන) උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ මෙහි පහත සඳහන් විස්තර ඇතුළත් කර ලියාපදිංචි කිරීම සුදුසු බවට මම නිර්දේශ කරමි.

1. ලියාපදිංචි කළ යුතු දිස්ත්‍රික්කය: ..........................................................
2. ලියාපදිංචි කළ යුතු උප්පැන්න මරණ කොට්ඨාශය: ..........................................................මරණය සිදු වූ දිනය (ආසන්න වශයෙන්): ..........................................................
3. මරණය සිදු වූ ස්ථානය[1]: ..........................................................
4. මියගිය පුද්ගලයාගේ සම්පූර්ණ නම: ..........................................................
5. ස්ත්‍රී පුරුෂ භාවය සහ ජාතිය [2] : ..........................................................
6. වයස: ..........................................................
7. තත්වය නොහොත් වෘත්තිය: ..........................................................
8. දෙමව්පියන්ගේ සම්පූර්ණ නම:

   පියා: ..........................................................

   මව: ..........................................................

9. මරණයට හේතුව සහ භූමදානය හෝ ආදාහනය කළ ස්ථානය[3] : ..........................................................
   ..........................................................
10. දැනුම් දෙන්නාගේ සම්පූර්ණ නම, පදිංචිය සහ මියගිය පුද්ගලයාට ඇති ඥාති සම්බන්ධය :
   ..........................................................

ග්‍රාම නිලධාරී අත්සන: ..........................................

ග්‍රාම නිලධාරී - වසම හා නිල මුද්‍රාව: .......................................... දිනය : ..........................................

### දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / ප්‍රාදේශීය ලේකම්වරයාගේ පිටසන

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්,
.............................. කලාපය.

නිර්දේශ කර/ නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

..........................................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / ප්‍රාදේශීය ලේකම් දිනය ..........................................

### කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝගය

උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර්,
.............................. කොට්ඨාශය.

ඉහත සඳහන් වන මරණය ලියාපදිංචි කිරීමට .............................. දිස්ත්‍රික්කයේ .......................................... කොට්ඨාශයේ මරණ ලේකම්තැනට මෙයින් නියෝග කරමි.

..........................................

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් දිනය ..........................

1. මරණය සිදු වූ ස්ථානය සනාථ කර ගැනීමට නොහැකි නම් - අදාළ පුද්ගලයා "අවසන් වරට පදිංචිව සිටියේ .......... හි"ය යනුවෙන් යොදන්න.

2. ජාතිය - මෙහි යෙදිය යුත්තේ ජන වර්ගයයි.එනම් සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, ලංකා යෝනක ආදි වශයෙනි.

3.මරණයට හේතුව සහ භූමදානය හෝ ආදාහනය කළ ස්ථානය - "දිටවා සුළි කුණාටු ව්‍යසනය හේතුවෙන් අතුරුදහන්ව ඇති බැවින් මිය ගිය බව තරයේ විශ්වාස කිරීම." යනුවෙන් සඳහන් කරන්න. භූමදානය හෝ ආදාහනය කළ ස්ථානය - "නොදනී" යනුවෙන් යොදන්න.

# දිවුරුම් ප්‍රකාශය

.............................. දිස්ත්‍රික්කයේ ..............................................................................................
(ප්‍රකාශකගේ ලිපිනය)

පදිංචි ......................................................................................................වන මම .........................
(ප්‍රකාශකගේ සම්පූර්ණ නම) (ආගම)

වශයෙන් මෙහි පහත සඳහන් කරුණු සත්‍ය බවට අවංකවද, ගාම්භීරතා පූර්වකව ද මෙයින් දිවුරා ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දෙමි.

1. මෙහි ප්‍රකාශක මම වෙමි.

2. ...........................................................පදිංචිව සිටි ............................................................................
(අතුරුදහන් වූ අයගේ පදිංචි) (අතුරුදහන් වූ අයගේ සම්පූර්ණ නම)

.........................................යන අය මගේ ..................................................................... වන බවද,
(අතුරුදහන් වූ පුද්ගලයාට ප්‍රකාශකගේ ඇති ඥාති සම්බන්ධය)

3. ඔහු /ඇය ................................................දිනට පසු දක්නට නොමැති අතර ඔහු /ඇය ජීවතුන් අතර සිටින බවට කිසිම ආරංචියක් නැති බවද,

4. ඔහු /ඇය........................................................................................................................
.........................................................හේතුවෙන් අතුරුදහන් වී ඇති බව මම විශ්වාස කරන බවද,
(අතුරුදහන් වීමට හේතුව)

5. මා විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ලබන .................................... දින දරණ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවද 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 15 (අ) වගන්තිය යටතේ දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කිරීම හෝ අසත්‍ය තොරතුරක් සැපයීම හේතුවෙන් මා මෙම පනත යටතේ වරදකට වරදකරු වන බව හොඳාකාරවම දන්නා බවද, මහාධිකරණය විසින් පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට අවුරුදු 5කට නොවැඩි වූ කාලයකට බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් නියම වන බව මා දන්නා බවද ප්‍රකාශ කරමි.

(රු.50/- මුද්දර)

දිවුරුම් ප්‍රකාශකගේ අත්සන

ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක විසින් මෙම දිවුරුම් ප්‍රකාශය කියවා බලා නිවැරදි බව වටහාගෙන වර්ෂ 20...... ක් වූ ............... මස ..........
දින ........................................ දී
මා ඉදිරියේදී දිවුරා ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දෙමි.

මා ඉදිරියේ දී අත්සන් කරන ලදී.

දිවුරුම් කොමසාරිස්/සමාදාන විනිශ්චයකාර තැන.
(සමාදාන විනිශ්චයකාර තැනගේ නිල මුද්‍රාව)

❖ අනවශ්‍ය වචන කපා හරින්න.

ඇමුණුම 03

මාගේ අංකය :

ප්‍රාදේශීයලේකම් කාර්යාලය

...............................

20.......................

.............................................. මහත්මයා/මහත්මිය

..............................................

..............................................

**<u>2010 අංක 19 දරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන පනත) යටතේ අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙනි.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් ..................................(ග්‍රා/නි.වසම) ග්‍රාම නිළධාරී වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය හා බැඳේ.

එම ඉල්ලුම් පත්‍රය පහත පහත කරුණු මත ප්‍රතික්ෂේප කරන බව මෙයින් දන්වා සිටිමි.

..........................................................................

..........................................................................

..........................................................................

මෙම තීරණය සම්බන්ධයෙන් අභියාචනා කරන්නේ නම් මෙම ලිපිය අත්සන් කළ දිනයේ සිට මසක කාලයක් ඇතුළත ඊට අදාළ අභියාචනය මා වෙත නොපමාව යොමු කිරීමට කටයුතු කරන්න.

මෙයට සේවයට කැපවූ

.........................................................

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

ඇමුණුම 04

# දැන්වීමයි

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ ( තාවකාලික විධිවිධාන) පනත

ඉහත සඳහන් පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම සඳහා මා වෙත ලැබී ඇති ඉල්ලුම් පතක පිටපතක් මේ සමඟ එවමි.

02.මෙම මරණය ලියාපදිංචි කිරීමට විරුද්ධතාවයක් ඇත්නම් එම විරෝධතාවය මෙම දැන්වීමේ දින සිට එක් මාසයක් ඇතුළත මා වෙත ලිඛිතව ඉදිරිපත් කරන මෙන් මෙයින් දන්වමි.

03.විරෝධතා ඉදිරිපත් කිරීමේ දී එසේ විරෝධය පෑමට හේතු පැහැදිලිව දක්වමින්, විරෝධතා ඉදිරිපත් කරන්නා විසින් සහ වෙනත් යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මඟින් එකී විරෝධතා තහවුරු කරනු ලැබිය යුතුය.

............................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

දිනය : ..............................

.............................. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

දැන්වීම ප්‍රදර්ශනය කරන දිනය : 20............................

| |
|---|
| අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා මා විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍රයේ පිටපත මෙහි අලවන්න. |

ඇමුණුම 05

මගේ අංකය:

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
.......................................
.......................................
20..................................දිය.

ග්‍රාම නිලධාරි,
....................................

<u>අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම</u>

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ.............................. ...................................................................................................... ගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා ...................................................................................................... පදිංචි ...................................... ............................................................................................. විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් මේ සමග එවමි.

02. කරුණාකර එය ඔබේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කරන්න. ඉන්පසු ඒ බව මෙහි පහත සඳහන් ආකෘතිය මගින් මා වෙත වාර්තා කරන්න.

ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

---

ඔබේ අංකය:

.................................................

20...........................................දින

ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

.....................................................

<u>අතුරුදහන් වූ තැනැත්තෙකුගේ මරණයක් ලියාපදිංචි කිරීම</u>

ඉහත ලිපිය සමග එවන ලද 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ ..........................................................................................................ගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත 20.................................... දින සිට 20............................... දින දක්වා සති දෙකක කාලයක් මගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ලද බව මෙයින් වාර්තා කරමි.

.............................................
ග්‍රාම නිලධාරි

දිනය :

| නිල මුද්‍රාව |
|---|

ඇමුණුම 06

මගේ අංකය...........................

ප්‍රාදේශීයලේකම්කාර්යාලය,

...........................................

20...................................දිය.

නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,

........................................................ කලාපය.

<u>දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ ස්වභාවික ව්‍යසනයෙන් අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීම.</u>

2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීම(තාවකාලික විධිවිධාන)පනත යටතේ ...............................
.................................................................................................. යන අයගේ මරණය
ලියාපදිංචි කිරීම සඳහා................................................................................................. හි
පදිංචි ...........................................................................................................මහතා/මහත්මිය
විසින් ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර පහත සඳහන් ලියවිලි සමග ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.

1. ඉල්ලුම් පත්‍රය
11. දිවුරුම් ප්‍රකාශය
111. ග්‍රාම නිලධාරි සහතිකය
IV. වෙනත් ඇමුණුම් තිබෙනම්

02. මෙම මරණය ලියාපදිංචි කළ යුතු, අතුරුදහන්වීම සිදු වූ ස්ථානයට අදාළ රෙජිස්ට්‍රාර්ගේ විස්තරය මෙසේය.

- රෙජිස්ට්‍රාර්ගේ නම ...................................................
- උප්පැන්න මරණ කොට්ඨාසය ...................................................
- දුරකථන අංකය ...................................................

..............................................................

ප්‍රාදේශීය ලේකම් /දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

පිටපත: ඉල්ලුම්කරු වෙත -දැනගැනීම සඳහා

ඇමුණුම 07

මගේ අංකය..........................................

කලාප කාර්යාලය,

.........................................................,

20...................................................

...............................................................................මයා/මිය

...................................................................

...................................................................

විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්,

.......................................................................කොට්ඨාසය,

<u>දිට්වා සුළි කුණාටුවේ බලපෑමෙන් ඇති වූ ස්වාභාවික ව්‍යසනයෙන් අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීම.</u>

2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීම (තාවකාලික විධිවිධාන) පනත යටතේ .................................................................................................................................. යන අයගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා ................................................................................................................................ හි පදිංචි ......................................................................................................... මහතා/මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත්‍රයේ සඳහන් මරණය ලියාපදිංචි කිරීමට මෙයින් නියෝග කරමි.

02. එකී මරණය විධිමත් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව ඉල්ලුම්පත්‍රයේ සඳහන් ඉල්ලුම්කරු වෙත නොමිලයේ නිකුත් කළ යුතු මරණ සහතිකය ලැබීමට සැලැස්විය යුතුය.

03. අදාල මරණ සහතිකයේ දෙවන පිටපත භාරදීමේදී මෙම අයදුම්පත්‍රය හා දිවුරුම් ප්‍රකාශය දෙවන පිටපත සමග ගොනුකර භාරදිය යුතුය.

04. මරණ සහතිකයෙහි දැනුම් දෙන්නාගේ අත්සන යන ස්ථානයෙහි "2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ ලියාපදිංචි කරන ලදී" යනුවෙන් සඳහන් කළ යුතුය.

.................................................

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්,

...................................කලාපය.

පිටපත :

01. ප්‍රාදේශීය ලේකම් — කරු.දැ.ගැ.ස.

02. ඉල්ලුම්කරු — දැන ගැනීම සඳහා